# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2129/66 - 2019 ජුනි මස 26 වැනි බදාදා - 2019.06.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### කාර්මික ආරවුල් පනත (131 වන පරිච්ඡේදය)

ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත් මාලාවේ (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) 131 වන පරිච්ඡේදය වූත්, 1957 අංක 14 හා අංක 62 සහ 1962 අංක 04 දරන කාර්මික ආරවුල් (සංශෝධිත) පනත් වලින් සංශෝධිත වූත්, [1968 අංක 39 දරන කාර්මික ආරවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන] කාර්මික ආරවුල් පනතේ 22 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන වන මම,

01. කාර්මික අධිකරණයක් සංස්ථාපනය කිරීමට තෝරා ගත යුත්තන් අඩංගු මණ්ඩලයේ සාමාජිකයින් වශයෙන් මෙයට අමුණා ඇති උපලේඛනයේ නම් සඳහන් පුද්ගලයින් මෙයින් පත් කරමි.

02. එම සාමාජිකයින්ගේ ධුර කාලය පත්වීම බලාත්මක වන දින සිට වර්ෂ තුනක කාල පරිච්ඡේදයක් ලෙස ද මෙයින් නියම කරමි.

මෛත්‍රීපාල සිරිසේන,
ජනාධිපති.

2019 ජුනි මස 24 වැනි දින,
ජනාධිපති කාර්යාලය,
කොළඹ 01.

උපලේඛනය

| | | |
|---|---|---|
| 01. | එම්. ඊ. ජී. සමරවීර මහතා | විශ්‍රාමික සහකාර කම්කරු කොමසාරිස් |
| 02. | කේ. ඒ. පියරත්න මහතා | නීතිඥ |
| 03. | ඒ. එම්. කරුණාරත්න මහතා | නීතිඥ (හිටපු කම්කරු කොමසාරිස්) |
| 04. | එච්. ආර්. එල්. සුගතදාස මහතා | නීතිඥ (හිටපු සහකාර කම්කරු කොමසාරිස්) |
| 05. | ඒ. ජී. කේ. කරුණාරත්න මහතා | නීතිඥ |
| 06. | කුමාරි ධනපාල මහත්මිය | නීතිඥ |
| 07. | පී. මහාදේව මහතා | විශ්‍රාමික කම්කරු කොමසාරිස් |
| 08. | වී. ජයරත්න මහතා | නීතිඥ |
| 09. | ඒ. ඒ. වීරසූරිය මහතා | විශ්‍රාමික සහකාර කම්කරු කොමසාරිස් |

07 - 321


1A - G 30391 — 377 (2019/06) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*